**රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2019**

**------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 17(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විද්‍යායතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසදීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමටප්‍රමාණවත්“මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විද්‍යායතනය විසින් 2017 වර්ෂයේදී සිසුන්ගෙන් අයකර ගනු ලැබූ රු. 1,225,000 ක පුස්තකාල තැන්පතු මුදල් රෙගුලාසි 381 පරිදි භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2017 මැයි 05 දින රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ශිෂ්‍ය සුබසාධක අරමුදල නමින් ආරම්භ කරන ලද ඉතුරුම් ගිණුමක තැන්පත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු. 1,354,393 ක් වූ එහි ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළයුතු අතර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පාරිතෝෂික සඳහා වෙන්කිරීම මූලික වැටුප පදනම් කරගෙන ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පාරිතෝෂික වෙන් කිරීම් රු. 448,500 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |

**1.5.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 94(1) | වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැදීමකට හෝ නොබැඳී සිටිය යුතු වුවද විද්‍යායතනය 2018 වර්ෂයේදී රු. 7,964,770 ක් වටිනා උපකරණ ණය පදනමින් මිලදීගෙන සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදානවලින් එම වැය දරා තිබුණි. | 2020 වර්ෂයේ වඩාත් විධිමත්ව ප්‍රසම්පාදන කාර්යය කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | නිලධාරීන්ට දීමනා හා වෙනත් මූල්‍යාධාර ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගතයුතු වුවද, ඊට පටහැනිව පාලක මණ්ඩලයේ අනුමැතිය මත පිලිතුරු පත්‍ර ලකුණු කිරීම, විභාග සුපරීක්ෂණය හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු. 956,465 ක් වැය කර තිබුණි. | ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කටයුතුවලට බාධාවක් නොවී අදාල විභාග ක්‍රියාවලිය පවත්වා ගැනීමට මෙම චක්‍රලේඛය අනුව කටයුතු කරමින් පවතී. මෙය උසස් අධ්‍යාපන තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර අදාල අනුමැතීන් ලබා ගැනීමට නියමිතය. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED/ 12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 7.4.5 ඡේදය | විද්‍යායතනය සම්බන්ධයෙන් වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් 2015 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2020 වර්ෂයේදී සිදු කිරීමට නියමිතව ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.149,673 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,100,693 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 951,020 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන රු. 2,402,100 කින් වැඩි වී තිබුණද විලම්භිත ආදායම් ක්‍රමක්ෂය රු. 3,326,789 කින් අඩු වීමත් සේවක පිරිවැය රු. 4,573,257 කින් වැඩි වී තිබීමත් මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විද්‍යායතනයේ පවත්වනු ලබන විලේපනවේදය (Cosmetology) පාඨමාලාව සඳහා නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ විද්‍යාගාරය අළුත්වැඩියා කිරීම හා විද්‍යාගාර උපකරණ සඳහා පිළිවෙලින් රු.1,817,773 ක් හා රු. 2,775,946 ක් දරා තිබුණු අතර 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කථිකාචාර්යවරුන් දෙදෙනෙකු වෙත එකතුව රු. 1,272,507 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද 2017/ 2020 අධ්‍යයන වර්ෂයට අදාලව සිසුන් 16 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර ඉන් සිසුන් 9 දෙනෙකුම පාඨමාලාව හැර ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා සිසුන් බඳවාගෙන නොතිබුණු අතර එක් කථිකාචාර්යවරයෙකු පමණක් පාඨමාලාව සඳහා අනුයුක්ත කර තිබුණි. | 2018 හා 2019 වර්ෂවල සිසුන් බඳවා ගැනීමට කටයුතු කලද ප්‍රමාණවත් සිසුන් නොමැති වීම නිසා එම අධ්‍යයන වර්ෂ සඳහා බඳවා නොගන්නා ලදී. මෙම විද්‍යාගාර සම්පත් යොදාගැනීමේ ඵලදායීතාවය ඉහල දැමීම සඳහා ඉදිරියේදී වෙනත් ආයතනයක් සඳහා බදු පදනම මත ලබාදීමට සැලසුම් කර ඇත. | සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) 2019/2022 අධ්‍යයන වර්ෂය සඳහා විද්‍යායතනයේ සෑම පාඨමාලාවක් සඳහාම අවම වශයෙන් සිසුන් 30 | 2019 වර්ෂයේ දී කැඳවීම් කල සිසුන් 264 අතුරින් 2019 වර්ෂයට අදාලව සිසුන් 209 බඳවා ගෙන ඇත්තේ එක් | සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගතහැකි වන පරිදි |

| | | |
|---|---|---|
| දෙනෙකු බඳවා ගැනීමට පහසුකම් පැවතියද පාඨමාලා 08 සඳහා අඩු සිසුන් සංඛ්‍යාවක් බඳවාගෙන තිබුණු අතර බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 18 සිට 29 දක්වා පරාසයක විහිදී පැවතුණි. | පාඨමාලාවකට අවමය සිසුන් 15 කට වඩා නොඅඩු වන ලෙසිනි. පවතින ඉඩපහසුකම් හා සැලකීමේ දී එක් කණ්ඩායමකට සිසුන් 30ක උපරිමයට බඳවා ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතාවයක් පවතී. | අවම වශයෙන් බඳවාගත හැකි සිසුන් ප්‍රමාණය බඳවාගැනීමට කටයුතු කිරීම සුදුසුයි. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ නිකුත් කරන ලද විභාග ප්‍රතිඵල අනුව පාඨමාලා 05 කට අදාලව ඇති විෂයන් 07 ක් සඳහා සිසුන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතයෙහි අඩුවීමක් නිරීක්ෂණය විය. අසමත්වීමේ ප්‍රතිශතය සියයට 33 සිට 56 දක්වා පරාසයක පැවතුණි. | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ සම්පූර්ණ කර නොතිබීම නිසා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලැබීම හේතුවෙන් එම විෂයන් සමත්වීමේ ප්‍රතිශතයන් අඩුව ඇත. | විභාග අසමත්වීමට හේතු වූ කරුණු සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආහාර තාක්ෂණවේදය විද්‍යාගාරය සඳහා 2015 වර්ෂයේ දී මිලදී ගන්නා ලද රු. 2,367,254 ක් වටිනා විද්‍යාගාර උපකරණ සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් නිෂ්කාර්යව පැවතුණි. එම උපකරණ ක්‍රියාකරවීමට අවශ්‍ය රසායන ද්‍රව්‍ය ආදී පහසුකම් නොමැතිවීම ඊට හේතු වී තිබූ අතර එම භාණ්ඩවල වගකීම් කාලයද අවසන්ව තිබුණි. එසේම 2015 ජූලි 01 දින නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මගින් ලබාදී තිබුණු රූපවාහිනී පසු නිෂ්පාදන තාක්ෂණවේද පාඨමාලාවට අදාල නොවන රු. 423,243 ක්වූ මේස මයික්‍රෝෆෝන (Table Microphone) 31 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී එම භාණ්ඩ ආයතනයේ Resource Center හි යොදා ගැනීමට කටයුතු කරන අතර රසායන ද්‍රව්‍ය මිලදී ගනු ලැබුවේ 2019 දෙසැම්බර් හා 2020 ජනවාරි වන අතර අධ්‍යයන කටයුතු ආරම්භ කල පසු ඒවා නිසි පරිදි භාවිතා කිරීමට අපේක්ෂා කරයි. Sausage Filler උපකරණය සඳහා Smoker උපකරණයක් මිලදී ගැනීමෙන් අනතුරුව ඉහත උපකරණය භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. | සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනයේ කථිකාචාර්ය තනතුරු 05 ක් පුරප්පාඩුව පැවති අතර පාඨමාලා සඳහා ප්‍රමාණවත් කථිකාචාර්යවරුන් සංඛ්‍යාවක් බඳවාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු. 1,674,900 ක් වැයකර තිබුණි. | විද්‍යායතනය විසින් පවත්වාගෙන යනු ලබන්නේ තාක්ෂණවේදී පාඨමාලාවක් නිසා මෙහි විෂය නිර්දේශය අනුව ක්ෂේත්‍රයේ සිටින බාහිර දේශකයින්ගේ සේවය අත්‍යාවශ්‍ය කරුණක් වන අතර අධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්නා තත්වය අනුව කටයුතු කරමින් පවතී. | අධ්‍යයන කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කල යුතුය. |